# ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් - පුරප්පාඩු

**පූර්ණ රජය සතු සමාගමක් වන ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ පහත සඳහන් තනතුර සඳහා වර්ෂයක කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.**

## හෙද නිලධාරිනී තනතුර (කොන්ත්‍රාත් පදනම)

**(අ) සුදුසුකම්**

රජයේ හෙද සේවයේ වසර 05 කට වැඩි පළපුරුද්දක් ලබා තිබීම.

(රජයේ විශ්‍රාමික හෙද නිලධාරිනියන් සම්බන්ධයෙන් විශේෂයෙන් සලකා බලනු ඇත)

**(ආ) මාසික දීමනාව**

රු. 37,500/- ක මාසික දීමනාවක් මෙම තනතුර වෙනුවෙන් ගෙවනු ලැබේ.

**(ඇ) වෙනත්**

I. අවුරුද්දක කොන්ත්‍රාත් කාලය සඳහා පමණක් බඳවා ගනු ලබන අතර, එම කාලය දීර්ඝ කිරීමටද ඉඩ ඇත.

II. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

III. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

IV. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

V. සේවකයා විසින් සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය 10% ක් දැරිය යුතු අතර, සමාගම විසින් ඒ සඳහා 15% ක් දරනු ලැබේ. සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලට 3% ක දායකත්වයක් ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම මගින් දරනු ලැබේ.

VI. ජාඇල ප්‍රදේශයේ අවට අයදුම්කරුවන් පිළිබඳව විශේෂ ලෙස සලකා බලනු ලැබේ.

**(ඈ) වයස**

වයස අවුරුදු 65 දක්වා සලකා බලනු ලැබේ.

දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත්‍ර තම අදාළ දෙපාර්තමේන්තුවල / ආයතනවල ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

ඉහත තනතුර සඳහා තමා විසින් සකස් කරන ලද අයදුම්පත් අදාළ සහතික පත්‍රවල ඡායාපිටපත් ද සමග 2021.08.13 දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"හෙද නිලධාරිනී තනතුර"** (කොන්ත්‍රාත් පදනම) යනුවෙන් පැහැදිලිව සටහන් කර තිබිය යුතුය.

**සභාපති,**
**ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්,**
**තැ.පෙ. 17, කපුවත්ත, ජා-ඇල.**